ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 2025 සැප්තැම්බර් 07 බිනර කළාපය

දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න"

"නගරං යථා පච්චන්තං - ගුත්තං සන්තරබාහිරං
ඒවං ගෝපේථ අත්තානං - ඛණෝ වේ මා උපච්චගා
ඛණාතීතාහි සෝචන්ති - නිරයම්හි සමප්පිතා

(ධම්ම පදය - පාප වග්ග)

සුපින්වතුනි,

ධර්මය නොදන්න කෙනාට සසර දිගයි කියල (දිසෝ බාලානං සංසාරෝ - සද්ධම්මං අවිජානතං බුදුහාමුදුරුවෝ කොසොල් රජතුමාට දේශනා කළා. ඒ නිසා බෞද්ධයන් වශයෙන් අපි සංසාරය කෙටි කර ගැනීම සඳහා ධර්මය ගැන දැනගන්න ඕන. දිගු ගමනක් පයින් යනව නම් අපට ගොඩක් මහන්සියි. ඒ වගේම ගමන බොහොම දුර වගේ දැනෙනවා. වාහනයක යනව නම් ඉක්මනට යන්න පුළුවන්. ධර්මයත් නිවන කරා අප රැගෙන යන වහනයක් වගෙයි, කියල ධර්මරථ සූත්‍රයේ සඳහන් වෙනවා. ඒ නිසා ඉඩ ලැබෙන විදියට ටිකෙන් ටික තථාගත ධර්මය වටහා ගැනීමට සියලු දෙනා මහන්සි ගත යුතුයි. ඒ රථයට මහ පෙන්වන්නේ 'සම්මා දිට්ඨි' නමැති ගැල් නායකයා. අප සිතිය යුතු දේ, කළ යුතු දේ, කිව යුතු දේ, එමගින් පෙන්වා දෙනවා. ඒ අනුව ජීවත් වෙන්න උගන්වනවා.

නිවැරදිව දකින විට නිවැරදිව හිතනවා. නිවැරදිව හිතන කොට කය වචන දෙකින් නිවැරදි දේ කරනවා. ජීවිතය ධාර්මික වෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගය ගොඩ නැගෙන්නේ සම්මා දිට්ඨිය මතයි. දහම් ඇසීම, දහම් පොතපත කියවීම, ගැටළු තැන් ගැන ධර්ම සාකච්ඡා කිරීම මගින් සම්මා දිට්ඨිය ගොඩ නගා ගන්න පුළුවන්. එහෙම කළොත් ඔබට මේ දිගු සසර කෙටි කර ගන්න පුළුවන්.

මාතෘකා වශයෙන් තබාගන්නා මේ ගාථාව ධම්ම පදයේ පාප වග්ගයේ සඳහන් වෙනවා. ඈත පිටිසරබද ප්‍රදේශයක තියෙන නගරයක් හැම විටම සොර සතුරු තර්ජනවලට මුහුණ පානවා. හොඳ ආරක්ෂාවක් නොතිබුනොත් එය පහසුවෙන්ම සතුරන්ට යටත් වෙනවා. ඒ නිසා හොඳ සෝදිසියෙන් ඉන්න ඕන. අපේ ප්‍රමාදය නොසැලකිල්ල නිසා සතුරන්ට වාසියක් වෙනවා.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙවරම් වෙහෙරෙහි වැඩ වසන කාලෙ එක්තරා භික්ෂු පිරිසක් බුදුහාමුදුරුවන් වෙතට පැමිණ, වස් කාලයේදී භාවනා කිරීමට සුදුසු කමටහන් දෙන ලෙස ඉල්ලා සිටියා. බුදුහාමුදුරුවෝ ඒ භික්ෂූන්ගේ චරිත දිහා බලල, ඔවුන් තුළ ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්ම වැඩි ඇති ආකාරය සැලකිල්ලට ගෙන, එක් එක් භික්ෂූන්ට ගැලපෙන කමටහන් ලබා දුන්නා. එසේ කමටහන් ලබා ගත් මේ භික්ෂු පිරිස වස් වැසීම සඳහා ඈත පිටිසරබද ප්‍රදේශයකට වැඩම කළා. එහි කුඩා නගරයකට ආසන්නයේ තිබුණ කැලෑවක නතර වුණා. ජනාවාසයට නොදුරු ප්‍රදේශයක් නිසා බණ භාවනා කටයුතුවලට මිනිසුන්ගේ ක්‍රියාකාරකම් නිසා බාධාවක් වුණේ නැහැ. පිණ්ඩපාතය සඳහා බොහෝ දුර යන්න ඕන වුණෙත් නැහැ. ඒ කාරණය භික්ෂූන්ට ලොකු පහසුවක් වුණා.

ඒ ප්‍රදේශයේ මිනිස්සු මේ භික්ෂු පිරිස දැකළා බොහොම සතුටට පත්වුණා. උන්වහන්සේලාට වැස්සෙන් කරදරයක් නොවී වැඩ සිටීමට තාවකාලික සේනාසන තනා දුන්නා. දන් පැන් බෙහෙත් ආදියෙන් හොඳට උපස්ථාන කළා. භික්ෂූන් වහන්සේලාත් බොහොම සතුටින් භාවනා කටයුතුවල නිරත වුණා. මෙහෙම ඉන්න ලැබුණේ මාසයක් විතර කාලයක් පමණයි. නොසිතූ කරදරයකට මුහුණ පාන්න ඒ භික්ෂූන්ට සිදු වුණා. විශාල දාමරික පිරිසක් මේ කුඩා නගරයට කඩා වැදී නගර වාසීන්ගේ ධන ධාන්‍ය වගේම නගරෙ හිටිය තරුණ තරුණියන් පිරිසකුත් පැහැරගෙන ගියා.

දැන් මුළු ප්‍රදේශයම මළ ගෙයක් වගෙයි. දරුවන් අහිමිවුණු අය විලාප දෙනවා. තවත් සමහර අය නගරයේ ආරක්ෂාව බිඳී ගිය තැන නැවත සකස් කරනවා. රෑ දවල් දෙකේම නගරය වටා මුර සංචාරය කරනවා. පිණ්ඩපාතයේ වැඩියත් භික්ෂූන්ට ප්‍රමාණවත් තරමට ආහාර ලැබෙන්නේ නැහැ. ලැබෙන ටික බෙදා හදාගෙන වළඳලා උන්වහන්සේලාගේ ජීවිතය ගැට ගසා ගත්තා. වස් සමාදන් වෙලා සිටින නිසා ආපහු යන්නත් බැහැ. භාවනා කිරීමට තරම් කායික ශක්තියකුත් නැහැ. සෝවාන් ආදී මාර්ග ඵල අධිගමයකට පත්වෙන්න හිතා ගෙන ආවත් ඒ එකක් වත් කරගන්න බැරි වුණා. බොහොම අමාරුවෙන් ඉතිරි මාස දෙකක් ගත කළා. වස් පවාරණය කරලා සැවැත්නුවරට ගිහින් බුදුහාමුදුරුවන්ට වැඳලා එකක් පසෙක හිටියා.

බුදුහාමුදුරුවෝ ඔවුන් සමග සුවදුක් කතා කරලා හොඳින් භාවනා කළාදැයි ඇහුවා. භික්ෂූන් තමන් මුහුණ දුන් කරදරය ගැන පැවසුවා. ඒ වෙලාවේ බුදුහාමුදුරුවෝ මේ ගාථාවෙන් ධර්ම දේශනා කළා. නගරය ආරක්ෂා කරගන්න, පවුරු පදනම් බැඳලා මුරකාවල් තියලා කටයුතු කරනවා වගේ, නුඹලාත් සිත ආරක්ෂා කරගත යුතුයි. සිතට හොඳ ආරක්ෂාවක් තියෙනව නම් කෙලෙස් සතුරන්ට එහි ඇතුළු වෙලා කරදර කරන්න බැහැ. මුරකපොලු තියෙන තැනින් මෙහාට එන්න සතුරන්නට බැහැ.

නගරය ඇතුළට වෙලා ඉඳගෙන නගරය රැකගන්න බැහැ. නගරයෙන් පිටත තිබෙන, සතුරන්ට ඇතුළු වීමට ඉඩ තිබෙන තැන් අහුරන්න ඕන. නගර ආරක්ෂාවේ දුර්වල තැන් මොනවාද කියා සතුරන් නිතරම විමසිල්ලෙන් සිටිනවා. මුරට ඉන්න අය සතුරා ගැන, සතුරාගේ උපක්‍රම ගැන විමසිල්ලෙන් හිටියොත් සතුරාට එම බාධා බිඳගෙන නගරයට ඇතුළු වෙන්න බැහැ.

අන්න ඒ වගේ බාහිර ආයතන පහක් අපට තියෙනවා. ඇස, කන, නාසය, දිව, ශරීරය තමයි ඒ සතුරා එන්නේ ඔන්න ඔය ස්ථාන පහෙන්. එහෙම ඇවිත් සිත නමැති නගරය බිඳ දමන්න ඔවුන්ට පුළුවන්. කවුද මේ තැන්වලින් සිත නමැති නගරයට ඇතුළුවන සතුරෝ ? ඒ තමයි කෙලෙස් නමැති සතුරෝ. අපි විමසිල්ලෙන් නොසිටියහොත් එයාල සිතට ඇතුළු වෙනවා. සිතට පහර දෙනවා. එසේ පහර දීලා සිත නමැති නගරය ඇතුළෙම රහස් ගුහාවක හැංගෙනවා. හැංගිලා ඉඳගෙන පහර දෙනවා. කෙලෙස් නමැති සතුරන් සිතට ඇතුළු වෙලා හැංගිලා ඉන්නේ මන නමැති ආයතනය තුළයි. ඇස, කන ආදී දොරටු පහෙන් කෙලෙස් සතුරන් ඒම නතරවන විට මන ආයතනය නමැති ගුහාවේ සැඟවී සිටි සතුරන් සිත නමැති නගරයට වැදිලා පහර දීලා ඔක්කොම අවුල් කරනවා. ඇස ආදී ඉන්ද්‍රියවලින් අරමුණු ගන්නේ නැති වෙන කොට ඊට පෙර ඒවායින් ගත්ත අරමුණු මතුවෙලා අපේ සිත කෙලෙස් වලින් වසා ගන්නවා.

මේ දොරටු හය හොඳින් ආරක්ෂා කරගන්න නම් හොඳ මුරහටයන් ඒ ඒ තැන්වලට යොදවන්න ඕන. බුදු හාමුදුරුවෝ අපට පෙන්වල දීලා තියෙනවා ඒ සඳහා පත්කළ යුතු මුරකාරයන් දෙදෙනකු ගැන. ඒ තමයි සිහිය හා නුවණ. 'සති සම්පජඤ්ඤ'කියල ධර්මයේ මේ දෙක සඳහන් කරල තියෙනවා. සතිය නමැති මුරකාරයා ඇස නමැති දොරටුවලින් සිත නමැති නගරයට ඇතුළු වෙන්න එන රූප ආදී සතුරන් ගැන විමසිල්ලෙන් ඉන්නව. අරමුණක් එන විට මෙබඳු කෙනෙක් එනවා යැයි නුවණ නමැති අනෙක් මුරකාරයාට පවසනවා.

එවිට නුවණ නමැති මුරකාරයා ඇවිත් අර ආපු අරමුණ හොඳට පරීක්ෂා කරනවා. විශ්ලේෂණය කරනවා. හේතු ප්‍රත්‍ය වශයෙන් බලනවා. එතකොට ඒ අරමුණ නිත්‍ය වේශයක් මවාගෙන, සැප විඳිය හැකි වේශයක් මවාගෙන අනිත්‍ය, දුක්ඛ, අසුභ එකක් බව වටහා ගන්නවා. සතර මහා ධාතූන්ගෙන් සකස් වූ එය හැම තිස්සෙම විපරිණාමයට පත්වෙන බව දැනගන්නවා. එවිට ඒ අරමුණේ ඇලෙන්නෙත් නැතුව, අරමුණ සමග ගැටෙන්නේත් නැතුව ඉන්න උත්සාහ ගන්නවා. මා දැකපු දේ, අහපු දේ රස විඳපු දේ, බාහිරව තියෙනවා කියල හිතන්නෙත් නෑ. ඒ බාහිරව තියෙනවාය කියල හිතන දේවල් දකින,අහන, රසවිඳින 'මම' කියා කෙනෙක් ඉන්නවා කියල හිතන්නෙත් නෑ. මේක තමයි නුවණ නැමති මුරකාරයාගේ වැඩේ.

මෙන්න මේ විදියට ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියන් හයෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම (= කලින් ඉන්ද්‍රියන් ගෝචර වූ දේවල්) ගැන සිහියෙන් හා නුවණින් පරීක්ෂා කර බලන විට කෙලෙස් සතුරන්ගේ පැමිණීම නතර වෙනවා.

මේ ඇස, කන, නාසය, දිව, ශරීරය කියන ආයතන පහ බාහිර වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, කියන අරමුණු පහත් සතර මහා ධාතූන්ගෙන් සකස් වුණු හේතු ප්‍රත්‍ය ධර්මයන්ගෙන් හටගත්, පටිච්ච සමුප්පන්න ක්‍රියාවලියක් බව එවිට පෙනෙනවා. සත්වයා සංසාරේ ගමන් කරන්නේ මේ අභ්‍යන්තර බාහිර ගනුදෙනුවට මැදිහත්වෙලා ඒකට කැමති වන නිසයි. ඒ කැමැත්තට ඡන්ද රාගය කියල කියනවා. ඇස ආදී ඉන්ද්‍රියයන්ට රූපාදී අරමුණු ගෝචර වෙනවාත් සමගම මේ දෙකම වෙනස් වෙනවා. ඒ පරම්පරාවේම ඊළඟ එක ඇති වෙනවා. එහෙත් අපි අරගන්නේ අර නැතිවුණ අරමුණ. ඒක නැතත් අපි හිතනවා ඒක තියෙනවා කියල.

ඇත්තටම බැලුවොත් අපි හිතන්නේ බාහිර තියෙන රූපයත් ගැන නෙමෙයි. ඒ හේතු කොට ගෙන අපේ හිතේ ඇඳුන රූප සටහන ගැනයි. මලක් දැකල ආසා හිතිලා ඒක කඩාගන්න කොට අපි දැකපු මට නොවෙයි කඩා ගන්නේ, ඊට පසු අවස්ථාවක පවතින එකක්. එත් අපි හිතන්නේ ඒ දැකපු මලම යි කඩා ගත්තේ කියල. මේකට කියනවා විපල්ලාස හෙවත් විකෘතිය කියල. චේතනා හෙවත් සංඛාර ගොඩනැගෙන්නේ හිතේ ඇඳුන රූපය පිළිබඳවයි.

මේ යථා ස්වභාවය තේරුම් අරගෙන හැමවිටම සිහියෙන් හා නුවණින් යුක්තව වාසය කරන්න ඕන. බුදුදහම පවතින අෂ්ට දුෂ්ටක්ෂණවලින් මිදුණු මේ අවස්ථාව තමයි හොඳම අවස්ථාව. මේ අවස්ථාව මඟ හරවා ගත්තොත් දුකට පත්වන බවයි. බුදුහාමුදුරුවෝ මේ ගාථාවෙන් පෙන්වා දුන්නේ.

ඔබ සැමට තෙරුවන් සරණයි!